# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/48 - 2018 නොවැම්බර් මස 02 වැනි සිකුරාදා - 2018.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

5 වන සංශෝධනය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව**

අංක 1842/2 හා 2013 දෙසැම්බර් මස 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ අංක 1923/47 හා 2015 ජූලි මස 16 දිනැති, අංක 1979/33 හා 2016 අගෝස්තු මස 11 දිනැති, අංක 2086/22 හා 2018 අගෝස්තු මස 30 දිනැති සහ අංක 2095/9 හා 2018 ඔක්තෝබර් මස 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වෙන ආකාරයට සංශෝධනය විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 නොවැම්බර් මස 02 වැනි දින.

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 13.3 (ආ) ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**13.3 (ආ) උසස් කිරීමේ ක්‍රමය :**

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයෙකු සැම වසරකම ජූලි මස 01 හා ජනවාරි මස 01 දිනට පවත්නා පුරප්පාඩු අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

සටහන

1. පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාව නොඉක්මවන 13.3 (අ) හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාවක් පමණි.
2. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කිරීම පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.
3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

11- 770

1A - G 28845— 32 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*